සියලුම හිමිකම් ඇවිරුණි / All Rights Reserved]

# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

# පළමු වාර පරීක්ෂණය - 2019

**ශ්‍රේණිය : 13** | **නාට්‍ය හා රංග කලාව I** | **කාලය පැය : 3**

**පෙරදිග නාට්‍ය කලාව** | **පත්‍රය : I**

නම : - ........................................................................ අංකය............................

- **සැලකිය යුතුයි:-**
- **I , II යනුවෙන් කොටස් දෙකකි.**
- **නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුරේ අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.**

## I කොටස

1. **කලාව ගුණාත්මක අංශය ලෙස සලකා වර්ගීකරණයට අයත් ගොනුව වන්නේ,**
   i. ප්‍රාකෘති කලාව , ගැමි කලා , ලලිත කලා
   ii. ප්‍රාකෘති කලා , ජන කලා , ජනප්‍රිය කලා
   iii. ජනප්‍රිය කලා , ව්‍යවහාරික කලා , ලලිත කලා
   iv. ජනප්‍රිය කලා , ජන කලා , ලලිත කලා
   v. ප්‍රාකෘති කලා , ජන කලා , ලලිත කලා ( )

2. **ප්‍රාසාංගික කලාවේ මූලික නිර්ණයක් නොවන ප්‍රකාශය තෝරන්න.**
   i. සතර අභිනය භාවිත කිරීම
   ii. සජීවී ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කිරීම
   iii. රංග භූමික් භාවිත කිරීම
   iv. විනෝදාස්වාදයක් මෙන්ම ගැඹුරු ජීවන අත්දැකීමක්, ගැඹුරු වින්දනයක්, රසයක්, ආනන්දයක් ලබාදීම
   v. සජීවී රංගයක් වීම ( )

3. **නෘත්ත හා නෘත්‍ය වශයෙන් දැක්වෙන අර්ථ නිරූපණය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි පිළිතුර තෝරන්න.**
   i. නෘත් හා නට් ධාතුවලින් නෘත්ත හා නෘත්‍ය වචන උත්පාදනය වී ඇත.
   ii. නෘත්ත යනු ශුද්ධ නැටුම වන අතර නෘත්‍ය යනු ආංගික, සාත්වික හා වාචික අභිනය මාර්ගයෙන් කිසියම් භාවයක් ප්‍රකාශ වන නර්තනයකි.
   iii. නෘත්ත යනු ආංගික හා වාචික අභිනය භාවිත කරන අතර නාට්‍ය සඳහා සතර අභිනය භාවිත කරයි.
   iv. නෘත්ත සඳහා නළදමයන්ති හා කරදිය නෘත්‍ය සඳහා භරත නාට්‍යම්, මනිපුරි හා පහතරට නැටුම් ද උදාහරණ වේ.
   v. නෘත්ත යනු ශුද්ධ නැටුමකි. නෘත්‍ය යනු ආංගික හා සාත්ත්වික අභිනය මාර්ගයෙන් කිසියම් භාවයක් ප්‍රකාශ වන නර්තනයකි. ( )

**4. ආංගික අභිනයේ ප්‍රධාන ප්‍රභේදයන්හි වැරදි නිර්වචනය තෝරන්න.**

i. නළුවන්ගේ පාද චලන 'චාරි' නම් වේ

ii. වේදිකාවේ සිට ගන්නා ක්‍රම 'ස්ථානගත' නම් වේ

iii. හිසේ සහ බඳේ චලන ද සහිත ව චාරි හා හස්තවල සංයෝගයෙන් කෙරෙන ඉදිරිපත් කිරීම කණ නම් වේ

iv. හස්ත යනු අත් හා ඇඟිලි භාවිතයෙන් කරනු ලබන සංකේතාත්මක හා නාට්‍ය ධර්මී චලන වේ.

v. දුනුදිය ඇදීම, අහසින් යාම, ආශිර්වාද කිරීම ආදිය චාරි සඳහා උදාහරණ ය.

( )

**5. නාට්‍යධර්මී සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.**

i. විවිධ නියම අනුව රංග පීඨය මත ඉදිරිපත් කරනු ලබන කක්ෂ්‍යා විභාගය

ii. ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසයෙන්, වඩා එසවුණු පියවර පියවර තබමින් නැටීම හා ගමන් කිරීම

iii. ද්විත්ව රංගනය (double acting) දක්නට නොලැබීම

iv. සැප හා දුක දනවන ක්‍රියා ආත්මකොට ඇත්තාවූ ලෝක ස්වභාවය ආංගික අභිනයෙන් ඉදිරිපත් කිරීම

v. සියලු අභිනය අලංකාර අංග විලාසයෙන් යුතුව ඉදිරිපත් කිරීම. ( )

**6. දේශිය ශාන්ති කර්ම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

i. සූනියම් යක්ෂණිය යාග භූමියට ප්‍රවිෂ්ට වනුයේ සූනියම් යාගයේ ය.

ii. කපුයක්කාරිය පූනා මඩුවේ දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථාවකි.

iii. දුම්මල කිරි ගැසීම, පන්දම්, කොප්පරා පහන් මඟින් ආලෝකය ලබාගනි.

iv. ගම් මඩු හා දෙවොල් මඩු සබරගමු සම්ප්‍රදායේ පමණක් දක්නට ලැබේ.

v. ඇත්බන්ධනය හා මීබන්ධනය මඩු ශාන්ති කර්මවල නාට්‍යමය අවස්ථාවන්ය.

( )

**7. දේශීය ශාන්ති කර්මවල රඟමඩල සැරසිලි සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.**

i. රටයකුම් රංග භූමි අලංකරණය මල් මඩුව වේ.

ii. සූනියම් යාගයේ රංගභූමි අලංකරණය දහඅටපාලි තොරණ වේ.

iii. රඟමඩුලු සැරසිලි සඳහා ගොක්කොළ, කෙසෙල් ගසේ ද්‍රව්‍ය, හබරල කොළ ආදී ස්වභාවික ද්‍රව්‍ය යොදා ගනී.

iv. කොහොඹා කංකාරියේ කංකාරි මඩුව ප්‍රධාන රංගභූමි අලංකරණ වේ.

v. දෝතුළු පුවක්, කෙසෙල් කැන්, අන්නාසි තැඹිලි, ආදි ද්‍රව්‍ය කංකාරි මඩුව අලංකාර කිරීමට යොදා ගනි. ( )

**8. සොකරි ජන නාට්‍යයට අදාළ නොගැළපෙන වරණය තෝරන්න.**

i. පත්තිනි පූජාව මුල්කරගත් ශාන්ති කර්මයකි
ii. ඇතැම් චරිත වෙස්මුහුණු පළදින අතර ඒවා සරල වෙස් මුහුණු වේ.
iii. සොකරි ජන නාටකය ශ්‍රී ලංකාවේ පැරණිතම ජන නාටකයයි
iv. රංගාලෝකය සඳහා කිට්සන් පහන් භාවිත කරන ලදි
v. අනුකරණය හා අනුරූපණ මාධ්‍ය භාවිත කිරීම සුවිශේෂී ය ( )

**9. හෙළ ජන නාටකයට සම්බන්ධ නිවැරදි වරණය තෝරන්න.**

i. පූර්ව රංගනයේ පාත්‍රයකු ලෙස කාරියකරවනරාළ සැලකේ
ii. කෝලම් වලදී යොදා ගනු ලබන්නේ ලෝකධර්මී ශෛලිය
iii. කෝලම් රඟ දක්වෙන ස්ථානය 'තානායම් පොළ' නමින් හැඳින්වේ
iv. මහාකෝල සන්නියකා අපර රංගයේ පැමිණෙන චරිතයකි
v. අපර රංගයේ රජ බිසව පැමිණීමට පෙර සත්ව චරිත හා ආදි මානුෂීය චරිත නොපැමිණේ ( )

**10. නාඩගම් ජන නාටකය සම්බන්ධ වැරදි වරණය තෝරන්න.**

i. ක්‍රි. ව. 1800 දී තෙළිඟු බසින් රචිත හරිස්චන්ද්‍ර නාඩගම ප්‍රථම නාඩගමයි.
ii. හරිස්චන්ද්‍ර නාඩගම නිෂ්පාදනය කළේ අලගාමායිදු නම් නාට්‍යකරුවා විසිනි
iii. දකුණු ඉන්දීය තෙරුක්කූත්තු නම් වීදි නාටක ආභාසයෙන් පමණක් නාඩගම් ප්‍රභවය විය.
iv. බටහිර ඔපෙරා නාට්‍ය හා පීකිං ගීත නාට්‍යවලට සමාන කළ හැකිය.
v. නිශ්චිත පෙළක් දක්නට ලැබේ ( )

**11. නාඩගම් පිරිහීමට හේතුවක් නොවන්නේ,**

i. නූර්ති නාට්‍යයේ ආගමනය
ii. විවිධාකාර රාගතාල මිශ්‍රිත කර්ණ රසායන සංගීතය
iii. නාඩගමට විරුද්ධ වූ සමාජ අපවාද
iv. ආර්ථික සමාජ දේශපාලන විපර්යාසය
v. ආකෘතිය, අන්තර්ගතය හා රංගනයේ පිරිහීම ( )

**12. නූර්ති සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

i. වඩාත් ජනප්‍රිය නූර්ති රචකයා වූ ''ජෝන්ද සිල්වා සිංහල නාට්‍යයේ පියා'' , ''සිංහල ශේක්ෂ්පියර්,, , ''ලංකා කාලිදාස'' යන විරුද්ධාවලින් හඳුන්වයි.
ii. ජෝන්ද සිල්වාගේ නාට්‍ය කොටස් හතරකට බෙදේ.
iii. සී දොන් බස්තියන් ජයවීර බණ්ඩාර නූර්ති රචකයා ය.
iv. නාඩගමේ කවටයා නූර්තියේ බහුබූතයා ලෙස පෙනී සිටියේ ය
v. ''උරුට්ටුව'' නම විශේෂ සංගීත ක්‍රමය දක්නට ලැබේ. ( )

**13. ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍ය සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.**

i. මර්සලින් ජයකොඩි පියතුමාගේ පිටපතකට අනුව දූවේ පාස්කු රඟ දැක්වීම

ii. බොරලැස්සේ ලෝරන්ස් පෙරේරා විසින් බොරලැස්ස පාස්කු නාට්‍ය ආරම්භ කිරීම

iii. ලෙස්ලි බොතේජු හා ක්ලෙමන්ට් ප්‍රනාන්දු පාස්කු නාට්‍ය රචකයන්ය

iv. දූව පාස්කු සඳහා නාඩගම් ලක්ෂණ මෙන්ම පසම් ළතෝනි ගී යොදාගෙන නැත

v. පාස්කු සඳහා ස්ථාවර රංගභූමි භාවිතයට ගෙන ඇත ( )

**14. ''අඹ දඹ නාරං කෙසෙල් දෙල්'' ගීතය අන්තර්ගතව ඇත්තේ**

i. ජෝන්ද ද සිල්වාගේ රාමායණයෙහිය

ii. ඇහැලේපොල නාඩගමේය

iii. චාල්ස් ඩයස්ගේ පද්මාවතියේ ය

iv. බ්‍රම්ෆ්‍රොඩ් නාඩගමේ

v. ජොහානා නාඩගමේ ය ( )

**15. ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රජාකර්ම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

i. මිලින්ද ප්‍රශ්නයේදී නාගසේන ස්ථවිරයන් හා මිලිඳු රජු අතර සංවාදය නාට්‍යමය ස්වරයෙන් ඉදිරිපත් කරයි

ii. දොරකඩ අස්න පිරිත් පිංකම අවසානයේ සිදු කරන චාරිත්‍රයක් නොවේ

iii. ආලවක දමනයේදී රාජපුරුෂයන් අලව් කුමාරයා බිල්ලට දීමට නොපැමිණේ

iv. බෞද්ධ ප්‍රජාකර්මවල ආගමික ස්වරූපයක් මිස නාට්‍යමය ලක්ෂණ දක්නට නොලැබේ.

v. යුගාසන බණ භික්ෂූන් දෙදෙනෙකු අතර සිදුවන කවි ගායනයකි.( )

- **පහත දැක්වෙන කරුණු / සංකල්ප සුදුසු පරිදි තෝරා 16-19 දක්වා ප්‍රශ්න අංක ඉදිරියේ ඇති හිස්තැන් පුරවන්න. එසේ පිරවීමේදී එක් පිළිතුරකට අදාළ වරණ 03 ක් ඇති බවත් එම වරණවලට අදාළ ඉංග්‍රිසි අක්ෂර පිළිතුර සඳහා යෙදිය යුතු බවත් සලකන්න.**

| | | |
|---|---|---|
| A නාටක | E බුතයි | I එන්ගෙකි |
| B ෂිතෙ | F විකෘෂ්ට | J කාරියක්කරවනරාළ |
| C ගුරුළු රාස්ස | G මවරි බුතයි | K වික්‍රමෝර්වශිය |
| D නෙම්බුත්සු ඔදොරි | H තානායම් පොල | L ජො.හ. ක්‍යු |

16. සංස්කෘත නාට්‍යයට අදාළ වනුයේ ( )

17. නෝ නාට්‍යයට අදාළ වනුයේ ( )

18. කබුකි නාට්‍යයට අදාළ වුනයේ ( )

19. කෝලම් නාට්‍යයට අදාළ වනුයේ ( )

- **අංක 20 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු / සංකල්ප / නාට්‍ය 5 බැගින් දී ඇත. ඒ අතුරින් සෙසු පද හා නොගැළපෙන එක් පදයක් ඇත. එය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහනේ ලියන්න.**

20. i. කරළිය ii. කිට්සන් පහන් iii. මද්දලය
iv. හරිස්චන්ද්‍ර v. සී දොන් බස්තියන් ( )

21. i. බලිවාලා ii. සිරිසඟබෝ iii. විශ්වනාත් ලව්ජි
iv. මද්දලය v. චාල්ස් ඩයස් ( )

22. i. සීදුව ii. පේසාලේ iii. බොරලැස්ස
iv. මහ අම්බලන්ගොඩ

23. i. තෙන්පාංග ii. තෛපොංගල් iii. මාඩුපොංගල්
iv. සුරන් පෝ v. දීපවාලි ( )

24. i. සංකරම් ii. මකිඩි iii. කෝවලන්
iv. වසන්තම් v. වඩපාංග ( )

25. i. මනරංජන වැඩ වර්ජන ii. බෝඩිංකාරයෝ iii. තට්ටු ගෙවල්
iv. හරිම බඩු හයක් v. දුන්න දුනු ගමුවේ ( )

**26. නූතනයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රිසි නාට්‍ය ප්‍රවර්ධනයෙහිලා ක්‍රියා කරන්නන් වනුයේ,**
i. ඉන්දු ධර්මසේන, හේග් කරුණාරත්න, දීපානි සිල්වා
ii. ජෙරොම් ද සිල්වා, දීපානි සිල්වා, අයිරාගනී සේරසිංහ
iii. ජෙරොම් ද සිල්වා, ඉන්දු ධර්මසේන, රුවන්ති චිගේරා
iv. අර්නස්ට් මැකින්ටර්, හේග් කරුණාරත්න, පරාක්‍රම නිරිඇල්ල
v. රුවන්ති චිගේරා, දීපානි සිල්වා, ජෙරොම් ද සිල්වා

**27. ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කොට ඇති සිංහල නාට්‍ය කරු වන්නේ,**
i. එදිරිවීර සරත්චන්ද්‍ර
ii. කේ. බී. හේරත්
iii. ධර්මසිරි බණ්ඩාරනායක
iv. රංජිත් ධර්මකීර්ති
v. බන්දුල විතානගේ

**28. ආර්. ආර්. සමරකෝන්ගේ නාට්‍ය නිර්මාණ අන්තර්ගත වරණය තෝරන්න.**
i. කැළණි පාලම, ඉඩම, මෝදර මෝල
ii. ලෙඩක් නැති ලෙඩෙක්, අහසින් වැටුණු මිනිස්සු, ඉඩම
iii. කැළණි පාලම, අහසින් වැටුණු මිනිස්සු, ස්ත්‍රී
iv. ලෙඩක් නැති ලෙඩෙක්, මුතු කුමාරි, ස්ත්‍රී
v. පුස්ලෝඩං, ඉඩම, කැළණි පාලම

**29. සංස්කෘත නාට්‍යයේ "අර්ථෝපක්ෂේප" යන්නට අයත් වනුයේ,**

i. ප්‍රවේශක, විෂ්කම්භහ, නියාතාප්ති, ලාංග

ii. ආරම්භ, යත්ත, ප්‍රාප්තත්‍යාශා, නියතාප්ති, ඵලාගම


iii. ප්‍රවේශක, ආරම්භ, විෂ්කම්භ, යත්න, චූලිකා

iv. ප්‍රවේශක, විෂ්කම්භක, අංකමුඛ, අංකාවතාර, චූලිකා

v. ආරම්භ, විෂ්කම්භක, අභිමුඛ, අංකාවතාර, චූලීකා

- **පහත දී ඇති රූප හඳුනාගෙන 29 - 33 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අදාළ පිළිතුර අක්ෂර යොදා හිස්තැන් පුරවන්න.**

ක ග ජ ච



30. කෝලම් නාට්‍යයේ වෙස්මුහුණක් වනුයේ ( )
31. සන්නියකුන් යාගයේ වෙස්මුහුණක් වනුයේ ( )
32. නෝ නාට්‍ය සඳහා භාවිත වෙස්මුහුණක් වනුයේ ( )
33. කබුකි නාට්‍යයේ 'කුමදොරි' යක් වනුයේ ( )

- **පහත දැක්වෙන ඡායාරූප හඳුනාගෙන 34 - 37 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

ත ද න ය



34. හාස්‍යෝත්පාදක රංගනයකට ප්‍රසිද්ධ ශිල්පියා කවුද? ( )
35. ශ්‍රී ලංකාවේ ලෝකධර්මී නාට්‍ය වලට පුරෝගාමී නාට්‍යකරුවා වනුයේ ( )
36. ජන කරළියේ නිර්මාතෘ වනුයේ ( )
37. මිනර්වා නාට්‍ය හා සම්බන්ධ වනුයේ ( )

- **පහත දැක්වෙන සුප්‍රසිද්ධ කලා නිර්මාණ උපයෝගී කරගෙන 38 - 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුරේ අංකය වරහන් තුළ ඇති හිස්තැන් තුළ ලියන්න.**

**අ. සුමිදි නදිය** **ආ. නලදමයන්ති** **ඇ. ඇග්නි**

**38. 'අ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,**

i. කබුකි නාට්‍යයකි
ii. බුගකු නාට්‍යයකි
iii. නෝ නාට්‍යයකි
iv. ජපන් නාට්‍යයකි
v. බුන්රකු නාට්‍යකි

39**. 'ආ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,**

i. ගීත නාට්‍යයකි
ii. මුද්‍රා නාට්‍යයකි
iii. ගීත නාට්‍යයකි
iv. ඔපෙරාවකි
v. වේදිකා නාට්‍යයකි

40**. 'ඇ' අක්ෂරයෙන් දැක්වෙන්නේ,**

i. ඉන්දියානු නෘත්‍ය නාටකයකි
ii. චිත්‍රපටියකි
iii. ගීත නාට්‍යයකි
iv. ඔපෙරාවකි
v. බැලේ නාට්‍යයකි

## II කොටස

- **A හා B කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

### "A" කොටස

1. i. අභිඥාන ශාකුන්තලයට පදනම් වූ ප්‍රධාන මූලාශ්‍රය හඳුන්වන්න
   ii. පෙළ රචනයේදී එහිදී කර ඇති වෙනස්කම් මොනවාද?
   iii. චරිත නිරූපණයේදී කාලිදාසයන් දැක්වූ ප්‍රතිභාව සකුන්තලා හා දුෂ්‍යන්ත චරිත ඇසුරින් ඇගයිමට ලක් කරන්න.

2. i. අර්ථෝපක්ෂේප ක්‍රම යන්න හඳුන්වන්න.
   ii. අර්ථෝපක්ෂේප ප්‍රභේද නම් කොට ඉන් දෙකක් පැහැදිලි කරන්න.
   iii. නිර්දිෂ්ට පෙළ ඇසුරින් අර්ථෝපක්ෂේප අවස්ථා පෙළ ගස්වන්න.

3. i. නෝ නාට්‍යට බලපෑ කරුණු දෙකක් දක්වන්න.
   ii. නෝ නාට්‍යයේ දක්නට ලැබෙන සුවිශේෂිකා පිළිබඳ කරුණු පහක් දක්වන්න.
   iii. ''නෝ'' නාට්‍යයේ වස්තු විෂය මගින් බෞද්ධ දර්ශනය පිළිබඳ සාකච්ඡා කරයි. ඔබ කැමති එක් නාට්‍යයක් නිදසුන් කොට ගනිමින් කරුණු දක්වන්න.

### "B" කොටස

4. i. කුවේණි නාට්‍යයට පදනම් වූ කථා පුවත සැකෙවින් දක්වන්න.
   ii. කුවේණි නාට්‍යයේ එන ගැටුම් අවස්ථා හතරක් දක්වන්න.
   iii. කතා වින්‍යාසය ගොඩ නැගීමේදී රචකයා යොදාගත් සුවිශේෂී උපක්‍රමයකි නිර්මාණාත්මක චරිත නිර්මාණය. පූරක, දඩයක්කරු හා ගායක පිරිස, යන චරිත ඇසුරින් විමසන්න.

5. i. ''කබුකි'' නාටකයේ ප්‍රභවය කෙටියෙන් හඳුන්වන්න.
   ii. 'කබුකි' සඳහා යොදා ගන්නා සංගීතය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
   iii. කබුකි නාට්‍යයේ සුවිශේෂිතා දක්වන්න.

6. i. උඩරට හා පහතරටට ආවේණික ගැමි නාටක දෙකක් දක්වා ඒවා පවත්වන අරමුණු දෙක බැගින් දක්වන්න.
   ii. ඉහත ගැමි නාටකවල රංග ශෛලියේ දක්නට ලැබෙන සමානතා දක්වන්න.
   iii. ගැමි කලාකරුවා සමාජ ශෝධනයට ඉහත කලාංගයක් උපයෝගී කොට ගෙන ඇති අයුරු පැහැදිලි කරන්න.

**පිළිතුරු නාට්‍ය හා රංග කලාව I පෙරදිග නාට්‍ය කලාව**

**I පත්‍රය**

1. i. මහා භාරතයේ එන ශකුන්ලෝපාඛ්‍යානය

දුෂ්‍යන්ත දඩ කෙළියෙහි යෙදෙන විනාසකාරි පුද්ගලයෙකු වන අතර තපෝ වනයේදී ශකුන්තලා ගාන්ධර්ව විවාහයක් යෝජනා කරන අතර ශකුන්තලා ඔහුට කැමති වන්නේ පුතකු පිලිසිඳුගන යුවරජ පදවිය ඔහුට ලබාදීමේ ගැනීමේ පොරොන්දුව මතය. එහෙත් පසුදින රජතුමා ශකුන්තලාව කැන්දවාගෙන යෑමට නොපැමිණි අතර දරුවාට අවුරුදු හයක් වූ පසු ගමට ශකුන්තලා ගියද ඇය භාර නොගන්නා රජු අහසින් පැමිණි කට හඬකට බියවී රජු ඔවුන් පිළිගනී. ලකුණු 04

ii. දුෂ්‍යන්ත කපටි අවස්ථාවාදී පුද්ගලයකු ලෙස දක්වා තිබීම වෙනුවට ප්‍රේක්‍ෂ අනුකම්පාව ලැබෙන සේ චරිතය ගොඩ ගැනීම

දෛවයේ වරද අනුව චරිත දේෂවලින් මුදවා ලීම

නව චරිත එක් කිරීම

නව සිදුවීම් එක් කිරීම

මුදු පැළඳීම්, ධීවරයා හා බැඳුණු සිදුවීම්, දුෂ්‍යන්ත සකුන්තලාගෙන් සමාව අයැදීම, මාරිච් අසපුවේදී දෙදෙනා විවාහ කරලීම

පරිසරය පිළිබඳ දත්ත ආකල්ප

පිය සෙනෙහස දාරක සෙනෙහස යනාදි කරුණු 2 ක් වත් නිදසුන් සහිතව දක්වා ඇති නම්. ලකුණු 05

iii. දුෂ්‍යන්ත හා ශකුන්තලාගේ චරිත නිර්මාණ කළ අයුරු නිර්දිෂ්ට පෙළෙන් නිදසුන් සහිත පැහැදිළි කිරීමට ඉදිරිපත් කළ ඇති කරුණු සලකා බලා ලකුණු පිරිනමන්න.

දුෂ්‍යන්ත චරිතය

ආචාරශීලිත්වය, විනීත බව, අවයාජත්වය, දාරක ප්‍රේමය, සාධුකත්වය, උදාර ගුණාංග

ශකුන්තලා චරිතය

ළඳ බොළඳ බව, පරිසරයට සතුන්ට ආදරය කිරීම, ස්වාමි භක්තිය, වැඩිහිටියාට ගරු කිරීම, ලැජ්ජාශීලි බව

2. i. අර්ථෝපක්‍ෂෙප නාට්‍යයේ ඉදිරිපත් කරනු ලබන සූච්‍ය කරුණු ප්‍රේක්ෂකයින්ට දැන්වීම සඳහා යොදාගනු ලබන උපක්‍රමයකි.

ii. ප්‍රවේශක, විෂ්කම්භක, අංකමුඛ, අංකාමතාර, චූලිකා ලකුණු 04

ඉහත සඳහන් ඕනෑම දෙකක් පැහැදිළි කිරීම ලකුණු 05

දුෂ්‍යන්ත සකුන්තලයෙහි 6 අංකයෙහි දක්වෙන ප්‍රවේශය ධීවරයා සමග සිදුවීම

නාට්‍ය ආරම්භයේ ප්‍රස්ථාව හා ප්‍රථම අංකය අතර විශ්කම්භය දක්නට ඇත.

සිව්වන අංකයේ මුල් කොටසේ දුර්වාසයක් ඍෂිවරයාගේ ශාපය. (නේපත්‍යාගාරයේ සිට)

ශකුන්තලා හා පිරිස හස්තිනාපුරයට පිටත් වෙද්දී වන දේවතාවියගේ ආගිංසනය (තිරය පිටුපසින් ඇසේ.)

3. i. ආගමික පරිසරය
ජන ජීවිතය හා බැඳුණු නර්තන ලකුණු 04

ii. නෝ වේදිකාවෙහි භාවිතා කරන උපකරණ
1. ත්සුරි මොනෝ
2. නො-දෝගු
3. නයෝ-දෝගු
සියලු උපකරණ සරලය, සැහැල්ලුය, රෙදි, බටපතුරු උපයෝගී කොට ගැනීම
පූජාසන, යහන ප්‍රාසාද රෙදිවලින් සෘජුකෝණාශ්‍රාකාර රාමු තුළින්
අත්භාණ්ඩ - ස්වභාවික ප්‍රමාණය සමාන වීම
ශෛලිගත හා සංකේතාත්මකව ඉදිරිපත් කිරීමට හැරමිටිය, බිලීපිත්ත, දුනු ඊතල
පන්දම් ආදිය යොදා ගැනීම. ලකුණු 05

iii. ජෝදෝ විහාරය, සුමිදි නදිය, හෝ වෙනත් ඕනෑම නෝ නාට්‍යයක් ගෙන බෞද්ධ
දර්ශනය ඒ තුළ අන්තර්ගත වන අයුරු පැහැදිලි කිරීම
ඉදිරිපත් කළ ඇති කරුණු සලකා බලා ලකුණු පිරිනමන්න. ලකුණු 06

4. i. විජය කුවේණි පුවත ගැන කෙටියෙන් ලියා දැක්වීම. ලකුණු 04
ii. දඩයක්කරු හා කුවේණියගේ දරුවන් අතර ඉතිහාසය පිළිබඳ ඇතිවන අදහස්
කාලය අතර ඇති පරස්පරය
කුවේණි මාළිගයෙන් පිටමං කිරීම
උසාවියේ නීතිය හා හෘද සැක්ෂිය අතර ඇතිවන හමුව. ලකුණු 05
iii. පූරක, දඩයක්කරු හා ගායක පිරිස මගින් රචකයා ඉටුකරගත් අරමුණු සඳහන් කිරීම
පූරක - මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම
දඩයක්කරු - සම්බන්ධිකාරක ලෙස
ගායක පිරිස - කාල කළමනාකරණය
ඉහත කරුණු පෙළ තුළින් පැහැදිළි කිරීම. ලකුණු 06

5. i. නෙම්බුත්සු බරදා නම් ආශ්‍රම නර්තන විශේෂයකින් ආරම්භ වීම. ඉයුමෝ ආශ්‍රමය
ආශ්‍රිතව කමො ගංඉවුරෙ ඔකුනි නළඟන ඉදිරිපත් කළ රැගුම ඇසුරින් බිහිවූවා යැයි
සැලකේ. ලකුණු 04

ii. ගිදයු, නගඋත, නොකිවසු හා කියොමොනො ගිදයු නොකිවසු හා කියමොනො
සඳහා කත් තුනකින් යුක්ත වූ සමිසෙන් නම් වූ භාණ්ඩය භාවිතා කිරිම. නගඋත
සඳහා නළාව ලොකු වටකුරු බෝය කුඩා අග්බෙර දෙක භාවික කරයි. ලකුණු 05

iii. නීතිරීති සම්මුතීන්ට අනුගත වීම
ශෛලිගත ස්වරූපයක් දැක්වීම
රූපණය තාත්විකත්වය ඉක්මවාලීම
සුවිශේෂී රඟහල් භාවිතය
පිරිමින් පමණක් රඟ දැක්වීම
ශෝභමාන රංග වස්ත්‍ර භාවිතය
'කුමදොරි' නමින් අංග රචනා විලාසයන් භාවිතා කිරීම
ආංගික හා සාත්වික අභින ප්‍රබල වීම

6. i. සොකරි - අරමුණු නම් කිරීම
කෝලම් - අරමුණු නම් කිරීම ලකුණු 04

ii. රාත්‍රී කාලයේ රඟ දැක්වීම
පිරිමින් පමණක් රඟ දැක්වීම
වෙස් මුහුණු භාවිතය
නාට්‍ය ධර්මී ශෛලිය භාවිතා කිරීම
බිහි වූ ප්‍රදේශයට අදාල රංග භාණ්ඩ භාවිතය
ශාන්ති කර්ම ලක්ෂණ සහිත වීම
උපත් කතාවක් දක්නට ලැබීම
කරුණු 05 ක් නම් කිරීම ලකුණු 2/21
පැහැදිලි කිරීම ලකුණු 05

iii. ප්‍රභූ පන්තිය උපහාසයට ලක් කිරීම
කුල භේදය
විවිධ වෘත්තීන් හා එහි ක්‍රියාකාරකම්හි අක්‍රමිකතා
අනියම් සබඳතා හා අල්ලස් ගැනීම්
කරුණු නම් කිරීම ලකුණු 03
විස්තර සහිතව පැහැදිලි කිරීම ලකුණු 06